# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2298/53 - 2022 සැප්තැම්බර් මස 23 වැනි සිකුරාදා - 2022.09.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රාජ්‍ය රහස් පනත**

1955 අංක 32 දරන රාජ්‍ය රහස් පනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝග

**රනිල් වික්‍රමසිංහ,**
ජනාධිපති හා ආරක්ෂක අමාත්‍ය,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය.

2022 සැප්තැම්බර් මස 16 වැනි දින
කොළඹ දී ය.

**නියෝග**

1. මෙම නියෝග 2022 අංක 01 දරන අධි ආරක්ෂක කලාප නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම නියෝගවල උපලේඛනයේ විස්තර කර ඇති ප්‍රදේශයෙන් සංයුක්ත වන අධි ආරක්ෂක කලාප මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

3. මෙම නියෝග ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා නිසි බලධරයා විය යුතු ය.

4. (1) යම් විශේෂ අවස්ථාවක දී හෝ පවත්නා ආරක්ෂක තත්ත්වය අනුව හෝ අධි ආරක්ෂක කලාපයන් තුළ ඇතැම් කටයුතු පාලනය කිරීම සඳහා නිසි බලධරයා විසින් විධිවිධාන සැලැස්විය හැකි ය.

   (2) නිසි බලධරයා විසින් මෙම නියෝග නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා කලින් කලට අවශ්‍ය විය හැකි පරිදි වූ විධාන නිකුත් කළ හැකි ය.

(3) (2) උප වගන්තිය යටතේ යම් තැනැත්තෙකු වෙත විධානයක් නිකුත්කර ඇති විට එම විධානයට අනුකූලව කටයුතු කිරීම එම තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

5. පොලිස්පතිවරයාගේ හෝ බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ පූර්ව ලිඛිත අවසරය ලබා ගෙන ඇත්නම් මිස කිසිම තැනැත්තෙකු විසින් අධි ආරක්ෂක කලාපයන් තුළ පිහිටි යම් මාර්ගයක, පිට්ටනියක, වෙරළක හෝ වෙනත් එළිමහන් ස්ථානයක කුමන ආකාරයක පෙරහැරක් හෝ ප්‍රසිද්ධ රැස්වීමක් පැවැත්වීම හෝ මෙහෙයවීම නොකළ යුතු ය.

6. (1) අධි ආරක්ෂක කලාපයන් තුළ යම් ගොඩනැගිල්ලක්, තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් හෝ යම් කැණීමක් සිදු කිරීමට අදහස් කරන යම් තැනැත්තෙකු විසින් සපුරාලිය යුතු අනෙකුත් නෛතික අවශ්‍යතාවයන්ට අමතරව ඒ සඳහා නිසි බලධරයාගෙන් ලබාගත් අවසර පත්‍රයක් ඇතිව මිස එම ගොඩනැගිල්ල, තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීම හෝ කැණීම නොකළ යුතු ය.

(2) සෑම අවසර පත්‍රයකම, නියම හා කොන්දේසි නිශ්චිතව දැක්විය යුතු අතර, එම ඉදිකිරීම හෝ කැණීම එම නියම හා කොන්දේසි වලට යටත්ව සිදු කළ යුතු ය.

(3) (1) උප වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රය කවර හෝ අවස්ථාවක දී යම් පොලිස් නිලධරයෙකු විසින් ඉල්ලා සිටින විට පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

(4) (1) උප වගන්තියේ සඳහන් බලධරයකු විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය යටතේ හෝ නිසි බලධරයා විසින් වාහන නවතා තැබීම සඳහා වෙන් කර ඇති ස්ථානයක හැර කිසිම තැනැත්තෙකු විසින් අධි ආරක්ෂක කලාපයන් තුළ යම් වාහනයක් නවතා තැබීම නොකළ යුතු ය.

7. සහතිකයේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියා අධි ආරක්ෂක කලාපයන් තුළ සිදු වූ බවට නිසි බලධරයාගේ අත්සන යටතේ නිකුත් කරන ලද සහතිකයක්, සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු අතර, එය එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

8. මෙම නියෝගවල විධිවිධාන පොලිස්පතිවරයා විසින් ක්‍රියාත්මක කිරීම නීත්‍යානුකූල වන අතර, අවශ්‍ය අවස්ථාවලදී එම කාර්යය සඳහා අධි ආරක්ෂක කලාපයන් තුළ යාන්ත්‍රිකව හෝ අන්‍යාකාරයකින් යම් කාර්යයක් කිරීම හෝ වාහන හෝ වෙනත් මාධ්‍යයක් භාවිතා කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

9. (1) යම් තැනැත්තෙකු මෙම නියෝග යටතේ අධි ආරක්ෂක කලාපයන් තුළ වරදක් සිදු කර ඇති බවට හෝ මෙම නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරන බවට සැක කිරීමට යම් පොලිස් නිලධරයෙකුට හේතු ඇති අවස්ථාවක එම පොලිස් නිලධරයා විසින් එම තැනැත්තා පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තෙකු මෙම නියෝග ප්‍රකාරව හෝ මෙම නියෝග උල්ලංඝනය කරමින් අධි ආරක්ෂක කලාපයන් තුළ වරදක් සිදුකර ඇති බව විශ්වාස කිරීමට පොලිස් නිලධරයෙකුට හේතු ඇති අවස්ථාවක, එම නිලධරයා විසින් එම තැනැත්තා ප්‍රශ්න කරනු ලැබිය හැකි ය.

(3) මෙම නියෝග උල්ලංඝනය කිරීම වරදක් විය යුතු ය.

(4) මෙම නියෝගවල සඳහන් සෑම වරදක් ම 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ එම පනතේ කාර්යය සඳහා සංඥෙය වරදක් ලෙස සළකනු ලැබිය යුතු ය.

(5) මෙම නියෝගවල යම් වරදක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලබන තැනැත්තෙකුට මහාධිකරණයක් විසින් මිස ඇප නොදිය යුතු ය.

10. (1) අධි ආරක්ෂක කලාපයන් තුළ පිහිටි යම් ගොඩනැගිල්ලක ප්‍රධාන පදිංචිකරු විසින් එම පරිශ්‍රයේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් පදිංචිව සිටින සියලු තැනැත්තන්ගේ ලැයිස්තුවක් එම ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයා විසින් නියම කරනු ලැබූ අවස්ථාවක දී ඔහු වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) උප වගන්තිය ප්‍රකාරව නියම කරනු ලැබූ පරිදි ලැයිස්තුවක් ඉදිරිපත් කරනු ලැබ ඇති විට, එතැන් පටන් එම ගොඩනැගිල්ල තුළ පදිංචිකරුවන්ගේ වෙනස් වීමක් පිළිබඳව, එම වෙනස සිදුවී පැය 24ක් ඇතුළත ප්‍රධාන පදිංචිකරු විසින් එම පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත දැනුම් දිය යුතු ය.

11. ප්‍රදේශයේ පොලිස් ස්ථානය භාර නිලධාරියා විසින් නියම කරනු ලැබූ අවස්ථාවක දී අධි ආරක්ෂක කලාපයන් තුළ පිහිටි සෑම රජයේ දෙපාර්තමේන්තුවක ම හෝ පුද්ගලික ආයතනයක ම සේවා යෝජකයා විසින් තම ආයතනයේ සේවය කරන සියලු ම තැනැත්තන් පිළිබඳ විස්තර අදාළ පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු ය.

12. (1) තත් කාර්යය සඳහා පොලිස්පතිවරයා විසින් යථා පරිදි බලය පවරනු ලබන පොලිස් නිලධරයෙකු විසින් අධි ආරක්ෂක කලාපයන් හි යම් පරිශ්‍රයකට ඇතුළු වී මෙම නියෝගවල 6 වැනි නියෝගයේ විධිවිධාන උල්ලංඝනය කරන්නේ ද යන්න පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

(2) මෙම නියෝගවල 6 වැනි නියෝගයේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් ක්‍රියාවක් සිදු කරන බවට සොයා ගනු ලැබුව හොත්, එසේ සොයාගන්නා පරීක්ෂාව සිදු කරන පොලිස් නිලධාරියා විසින් එම ඉදිකිරීම් කටයුතු හෝ කැණීම් කටයුත්තක් හෝ වෙනත් යම් ක්‍රියාවක් සිදු කිරීම වහාම නවත්වන ලෙස එම ඉදිකිරීම් හෝ කැණීම් කටයුතු භාර තැනැත්තා හෝ එම ක්‍රියාව කරනු ලබන යම් තැනැත්තෙකු වෙත නියම කරනු ලැබිය හැකි ය.

(3) (2) උප වගන්තිය ප්‍රකාරව යම් ඉදිකිරීම් කටයුතු හෝ කැණීම් කටයුතු දිගටම සිදු කිරීම නැවැත්වීමට නියම කිරීමෙන් පසු එම වැඩ දිගටම සිදු කරන යම් තැනැත්තෙක් මෙම නියෝග යටතේ වරදකට වරදකරු වන්නේ ය.

13. කවර හෝ හේතුවක් නිසා කිසිම තැනැත්තෙකු විසින් අධි ආරක්ෂක කලාපයන් තුළ රතිඤ්ඤා හෝ කවර හෝ විස්තරයකට අයත් ගිණිකෙළි නොදැල්විය යුතුය.

14. මෙම නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරන හෝ මෙම නියෝගවල විධිවිධාන යටතේ අවස්ථාවෝචිත පරිදි නිසි බලධරයා හෝ යම් පොලිස් නිලධරයකු විසින් කරන ලද හෝ දෙන ලද යම් නියමයකට හෝ විධිවිධානයකට අනුකූලව ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින නැතහොත් මෙම නියෝග යටතේ තම කාර්යය කරන අතරතුර දී, නිසි බලධරයා හෝ ඔහුගේ විධානය යටතේ ක්‍රියාකරන යම් තැනැත්තෙක් හෝ පොලිස් නිලධරයෙකු වළක්වන හෝ ඔහුට බාධා කරන නැතහොත් එසේ වැළැක්වීමට හෝ බාධා කිරීමට අන් තැනැත්තෙකුට කටයුතු සලස්වන යම් තැනැත්තෙක් මෙම නියෝග යටතේ වරදකට වරදකරු විය යුතුය.

15. මෙම නියෝග යටතේ වූ වරදක් සිදු කරන තැනැත්තෙකු රාජ්‍ය රහස් පනතේ 26(2) වගන්තියේ හි සඳහන් විධිවිධාන අනුව පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු වූ විට එම වගන්තිය යටතේ දඬුවමකට යටත් විය යුතු ය.

16. අර්ථනිරූපන -

"*පෙරහැර*" යන්නට 1865 අංක 16 දරන පොලිස් ආඥා පනතේ ඇති අර්ථය ම තිබිය යුතු ය.

## උපලේඛනය - (අ)

**පාර්ලිමේන්තු සංකීර්ණය**

*උතුරට* :- පොල්දූව හංදියේ සිට කථානායක නිල නිවස, කුඹක්ගහදූව පාර, රජමල්වත්ත පාර, ජයන්තිපුර හංදිය, දියවන්නා ජලාශය ඇතුළුව ජයන්තිපුර මාර්ගය සහ පාර්ලිමේන්තු මාර්ගය

*නැගෙනහිරට* :- ජයන්තිපුර මංසන්ධියේ සිට අල්කටාස් රථගාල, පාර්ලිමේන්තු ක්‍රීඩාංගනය, කියංනෑම් හංදිය, ජපන් මිත්‍රත්ව මාර්ගය, පහළවෙල පාර, කිඹුලාවල හංදිය දක්වා දියවන්නා ජලාශය ද ඇතුළුව

*දකුණට* :- කිඹුලාවල හංදියේ සිට තලවතුගොඩ මාර්ගය පින්නියර හංදිය දක්වා, සුදර්ශන මාවත, දහම් මාවත, ගමගේ මාවත, ඊයම්පෝරුව පන්සල පාර අතුරු මාර්ග ඇතුළුව පින්නියර දක්වා වූ ප්‍රදේශය සහ මාදිවෙල මන්ත්‍රී නිවාසය, මන්ත්‍රී නිවාස පිටුපස පිටවේල්ල පාර, දියවන්නා ජලාශය ඇතුළුව

*බටහිරට* :- පින්නියර හංදිය සිට බැද්දගාන හංදිය දක්වා තලවතුගොඩ මාර්ගය, බැද්දගාන මාර්ගය, පොල්දූව මාර්ගය, වෙහෙරකන්ද පාර, බැද්දගාන, නිපෝන් පාර ඔස්සේ පොල්දූව හංදිය දක්වා දියවන්නා ජලාශය ඇතුළුව

**(මෙම ප්‍රදේශය තුළ පිහිටි තානාපති මුක්තින් හිමි ස්ථාන හැර)**

**උපලේඛනය - (ආ)**

**ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණය, මහාධිකරණ සංකීර්ණය කොළඹ, මහෙස්ත්‍රාත් අධිකරණ සංකීර්ණය කොළඹ හා නීතිපති දෙපාර්තමේන්තුව**

*උතුරට* :- වේල්ලවීදිය පාර, අළුත්කඩේ වීදිය සිට බෙල්මන් වීදිය දක්වා

*නැගෙනහිරට* :- බෙල්මන් වීදිය සිට සාංචි ආරච්චි වත්ත පාර, අධිකරණ මාවත හංදිය දක්වා

*දකුණට* :- පාර්සල් වට රවුම, සාංචි ආරච්චි වත්ත පාර

*බටහිරට* :- ශාන්ත සෙබෙස්තියන් කන්ද පාර, මිහිඳු මාවත, ශාන්ත සෙබෙස්තියන් පාර.

**(මෙම ප්‍රදේශය තුළ පිහිටි තානාපති මුක්තින් හිමි ස්ථාන හැර)**

**උපලේඛනය - (ඇ)**

**ජනාධිපති ලේකම් කාර්යාලය, ජනාධිපති මන්දිරය, නාවික හමුදා මූලස්ථානය හා පොලිස් මූලස්ථානය**

*උතුරට* :- NSA වටරවුම හරහා චෛත්‍ය පාර දෙසින් පොලිස් මූලස්ථානය දක්වා.

*නැගෙනහිරට* :- යෝර්ක් වීදිය හා ලෝටස් පාර හන්දියේ සිට රීගල් සිනමා ශාලාව, බේරේවැව, මෝගන් පාර, ජස්ටිස් අක්බාර් මාවත දක්වා

*දකුණට* :- ජස්ටිස් අක්බාර් මාවත, ගාලුමුවදොර පාර, අක්බාර් මාවත පාලම සිට පැරණි යුධ හමුදා මූලස්ථානයේ බටහිර මායිම දක්වා බාලදක්ෂ මාවත ඇතුලත්ව.

*බටහිරට* :- චෛත්‍ය පාර හන්දියේ සිට ගාලුමුවදොර වටරවුම දක්වා මාර්ගය හා ඊට අදාල වෙරළ තීරය.

**(මෙම ප්‍රදේශය තුළ පිහිටි තානාපති මුක්තින් හිමි ස්ථාන හැර)**

**උපලේඛනය - (ඈ)**

**අකුරේගොඩ ආරක්ෂක අමාත්‍යාංශය හා යුධ හමුදා මූලස්ථානය**

*උතුරට* :- ආරක්ෂක අමාත්‍යාංශ මාවත

*දකුණට* :- දියවන්නා උද්‍යාන මාවත

*බටහිරට* :- පෙරේරා මාවත, පාසල් මාවත, දේසිංහ මාවත, ලුතිනන් කර්නල් අශෝක මාවත, ඩී.ජී. විජේසිංහ මාවත.

**(මෙම ප්‍රදේශය තුළ පිහිටි තානාපති මුක්තින් හිමි ස්ථාන හැර)**

**උපලේඛනය - (ඉ)**

**ගුවන් හමුදා මූලස්ථානය (කොම්පඤ්ඤවීදිය)**

*උතුරට* :- චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, බේරේ වැව,

*නැගෙනහිරට* :- බේරේ වැව, මෝගන් පාර,

*දකුණට* :- කිව් පාර, කුමාරරත්නම්, ජස්ටිස් අක්බාර් මාවත

*බටහිරට* :- රීගල් සිනමා ශාලාව සිට ජස්ටිස් අක්බාර් මාවත දක්වා බේරේ ඇල මාර්ගය

**(මෙම ප්‍රදේශය තුළ පිහිටි තානාපති මුක්තින් හිමි ස්ථාන හැර)**

**උපලේඛනය - (ඊ)**

**අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය (මල් පාර)**

*උතුරට* :- ඇතුලත මල් පාර ද,

*නැගෙනහිරට* :- සර් අර්නස්ට් ද සිල්වා මාවත (මල් පාර)

*දකුණට* :- 05 වන පටුමග

*බටහිරට* :- 27 වන පටුමග

**(මෙම ප්‍රදේශය තුළ පිහිටි තානාපති මුක්තින් හිමි ස්ථාන හැර)**

**උපලේඛනය - (උ)**

**අරලියගහ මන්දිරය (කොල්ලුපිටිය)**

*උතුරට* :- ගාලු පාර රොටුන්ඩා හංදිය සිට රොටුන්ඩා වටරවුම මාර්ගය හරහා පෙරහැර මාවත අල්විස් පාර හංදිය දක්වා ද,

*නැගෙනහිරට* :- ධර්මපාල මාවත අල්විස් පාර හංදිය, අල්විස් පාර, පෙරහැර මාවත හංදිය දක්වා ද,

*දකුණට* :- කොල්ලුපිටිය දුම්රියපොල මුහුදු තීරයේ සිට දුම්රියපොල පාර කොල්ලුපිටිය හංදිය, ධර්මපාල මාවත, ලිබර්ටි වටරවුම, අල්විස් පාර හංදිය දක්වා ද,

*බටහිරට* :- කොල්ලුපිටිය හංදිය සිට ගාලුපාර රොටුන්ඩා හංදිය දක්වා කොටස

**(මෙම ප්‍රදේශය තුළ පිහිටි තානාපති මුක්තින් හිමි ස්ථාන හැර)**

**උපලේඛනය - (ඌ)**

**ආරක්ෂක ලේකම් හා ත්‍රිවිධ හමුදාපතිවරුන් නිල නිවාස ප්‍රදේශය**

*උතුරට* :- බෞද්ධාලෝක මාවත, ජාවත්ත හංදිය, ජාවත්ත පාර කැප්පෙටිපොල මාවත හංදිය දක්වා ද,

*නැගෙනහිරට* :- කැප්පෙටිපොල මාවත ශ්‍රී සම්බුද්ධ ජයන්ති මාවත හංදියේ සිට ශ්‍රී සම්බුද්ධ ජයන්ති මාවත, තුංමුල්ල හංදිය දක්වා ද,

*දකුණට* :- කැප්පෙටිපොල මාවත හංදියේ සිට කැප්පෙටිපොල පාර, ශ්‍රී සම්බුද්ධ ජයන්ති මාවත හංදිය දක්වා ද,

*බටහිරට* :- තුංමුල්ල හංදියේ සිට බෞද්ධාලෝක මාවත ජාවත්ත පාර හංදිය දක්වා.

(මෙම ප්‍රදේශයට අයත් ඇතුලත මාර්ග - ස්ටැමෝර් චන්ද්‍රවංකය, මැකෙන්සි පාර, පැජට් පාර මහගමසේකර මාවත)

**(මෙම ප්‍රදේශය තුළ පිහිටි තානාපති මුක්තින් හිමි ස්ථාන හැර)**

EOG 09-0246

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.